# උපහාර ගීතයක්

හිමියනි, මා ඔබෙ යසෝදරාවයි
පෙරුම්පුරා ආ සංසාරේ
සොඳුරියෙ රාධා, මා ඔබෙ ක්‍රිෂ්නා
යමුනා ගංතෙර පිය මැන්නේ //

අපගේ යුගදිවි ගංගාවේ
ස්වර්ණ වසන්තය උදා වෙලා
සසර වසනතුරු හැම අත්බවයෙම
සඳකිඳුරන් සේ වෙලි පෙමිනා//

අතින’ත පටලා හසරැළි නංවා
දුක සැප විඳිනෙමු සෙනෙහෙ සිතින්
දිවි මග සැන්දෑ සමයයි එන්නේ
නිලඹර රන්වන් පැහැ ගන්නේ
ලෝදහමේ අසිරිය විඳගනිමින්
දිරිය හදින් යමු අපි දෙන්නා//

සෙනෙහස් පිනි දියරෙන් අප නාවා
සොමි කිරණින් හද සනසාලා
අපලොව එළිකළ දියණියනේ
ප්‍රාණ සමවූ දියණියනේ

කරුණා, මුදිතා, දයා ගුණෙන්
පින් පිඬුවන් රන් දියණියනේ
මේ සංසාරේ ඔබ තිදෙනා
ගෙනෙයි නිරතුරු වාසනා
සඳ කල්හිම වාසනා

ඔබ හැම අතගත් පතිකුමරුන්
මිනිපිරි කුමරී මුනුපුරු කුමරුන්
ගෙනෙයි අපහට වාසනා
අපි බැඳෙමූ රන් දමකින්
මේ සංසාරේ බැඳෙමු රන් දමකින්

පද රචනය කල්‍යාණි සෙනරත් යාපා
2009-08-14